# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2064/4 - 2018 මාර්තු මස 26 වැනි සඳුදා - 2018.03.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බණ්ඩාරවෙල - දියතලාව ඒකාබද්ධ ජල යෝජනා ක්‍රමයේ කුරුකුදේගම ජල පිරිපහදු ඒකකය හා නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මාර්තු මස 13 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1339.

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුකුදේගම ග්‍රාම නිලධාරී වසමේ කුරුකුදේගම ගමේ පිහිටි දඩුගලේවත්ත හා පල්ලේතැන්නවත්ත නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 03, රූඩ් 02 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් 4 :

කැබලි අංක : 01 - ප්‍රමාණය : අක්කර 01, පර්චස් 10

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඒ. එම්. රත්නායක මහතා හිමිකම් කියන මැදගෙදර වත්ත හා යෝජිත මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | ආර්. එම්. රත්නායක මහතා හිමිකම් කියන ඉඩම, ඇන්තනි සිල්වා හා තවත් අය හිමිකම් කියන ඉඩම හා යෝජිත මාර්ගය ; |
| *දකුණට* | : | කැබලි අංක 02 ; |
| *බටහිරට* | : | කුරුකුදේගම සිට පල්ලෙවෙල දක්වා මාර්ගය |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. කේ. පී. එෆ්. සිල්වා මහතා,
කොඩමවත්ත,
කුරුකුදේගම පට්ටිය ගෙදර.

1A - G 27357 — 40 (2018/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කැබලි අංක : 02 - ප්‍රමාණය : රූඩ් 01 පර්චස් 30 ක් පමණ

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 01 ; |
| *නැගෙනහිරට* | : ඇන්තනි සිල්වා හිමිකම් කියන පල්ලේතැන්න වත්ත ; |
| *දකුණට* | : කැබලි අංක 03 හා ඩබ්. එම්. බී. කපිල කුමාර හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : කුරුකුදේගම සිට පල්ලෙවෙල දක්වා මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. ඩබ්. එම්. සී. මල්කාන්ති මිය,
පල්ලේතැන්න වත්ත,
කුරුකුදේගම,
පට්ටිය ගෙදර.

කැබලි අංක : 03 - ප්‍රමාණය : අක්කර 01 ක් පමණ

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 2 ඇන්තනි සිල්වා හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : ඇන්තනි සිල්වා හිමිකම් කියන ඉඩම හා ඩබ්. බී. එම්. කරුණාසේන මහතා හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : කැබලි අංක 04 ; |
| *බටහිරට* | : ඩබ්. බී. එම්. කපිල කුමාර මහතා හිමිකම් කියන ඉඩම හා ඩී. එම්. දිසානායක මහතා හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. යූ. බී. රත්නායක මහතා,
පන්සල වත්ත,
වරකාදණ්ඩ,
පට්ටිය ගෙදර.

කැබලි අංක : 04 - ප්‍රමාණය : අක්කර 01 ක් පමණ

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 3 ; |
| *නැගෙනහිරට* | : ඩබ්. බී. එම්. කරුණාසේන මහතා හිමිකම් කියන ඉඩම හා ඇල මාර්ගය ; |
| *දකුණට* | : එච්. එම්. විජේපාල මහතා හා එච්. එම්. ගුණතිලක මහතා හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : ආර්. එම්. මහින්ද රණවීර මහතා හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. ආර්. එම්. මහේෂ් රත්නායක මහතා,
6 A, මිණිමුතු උයන,
උඩුගල්පොත,
බණ්ඩාරවෙල.

04 - 374

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට අඹතලේ කැළණි ගඟ හරහා ඉදිකරන ලද ලවණ බාධකයට හා නිළ නිවාස සඳහා ඉදිකර ඇති ප්‍රවේශ මාර්ගයට අදාළ ඉඩම් කොටස අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මාර්තු මස 13 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1330.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක : 278/A, බොල්ලෑගල ග්‍රාම නිලධාරී වසමේ බොල්ලෑගල ගමේ පිහිටි පැලවත්ත නැමති ඉඩම් කොටස පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු එම්. ජී. නසූර් මහතා විසින් 2009.03.05 දිනැතිව පිලියෙල කර ඇති අංක : 201 දරන සැලැස්මේ කැබලි අංක : 01 ලෙස දක්වෙන ප්‍රමාණයෙන් රූඩ් : 01, පර්චස් : 14.5 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

*උතුරට* : පාර ;
*නැගෙනහිරට* : එස්. ගුණසේකර මහතා හිමිකම් කියන ඉඩම ;
*දකුණට* : එස්. ගුණසේකර මහතා හිමිකම් කියන ඉඩම ;
*බටහිරට* : එස්. ගුණසේකර මයා, එන්. ඒ. රංජිත් පාලිත මයා හා ආනන්ද ගයනි හිමිකම් කියන මු. පි. ගම් 3398 පිඹුරේ කැබලි අංක : 1 ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. එන්. ඒ. ඩී. එස්. ගුණසේකර මිය,
නො : 346,
මානෙල්වත්ත පාර,
බොල්ලෑගල,
ගෝනවල.

04 - 375

---

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට පොල්පිතිගම ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ වැඩ භාර නිලධාරී නිල නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මාර්තු මස 13 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1337.

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්පිතිගම ග්‍රාම නිලධාරී වසමේ ගලපිටගම ගමේ නාගොල්ල විහාරය සතු පන්සල් වත්ත නැමැති ඉඩමෙන් පර්චස් : 20.1 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස හා පොල්පිතිගම සිට පන්සල දක්වා මාර්ගය ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* : 01. විහාරාධිපති ස්වාමීන් වහන්ස
නාගොල්ල පුරාණ රජමහා විහාරය,
පොල්පිතිගම.

02. මහා භාරකරු
මහභාරකාර දෙපාර්තමේන්තුව,
බුලස්පාර - කොළඹ 07.

04 - 376

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.